මාන්තායි නැගෙනහිර ප්‍රාදේශිය සභාව

මුලතිව් දිස්ත්‍රික්කය.

----------------------------------------------------------

1. මුල්‍ය ප්‍රකාශ.

----------------

1.1 මුල්‍ය ප්‍රකාශ ඉදිරිපත් කිරිම

--------------------------------

සමාලෝචිත වර්ෂය සඳහා වූ මුල්‍ය ප්‍රකාශ 2014 මාර්තු 20 දින විගණනය සඳහා ඉදිරිපත් කරන ලද අතර ඉකුත් වර්ෂය සඳහා වූ මුල්‍ය ප්‍රකාශ 2013 ජුනි 25 දින ඉදිරිපත් කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2014 සැප්තැම්බර් 15 දින සභාවේ සභාපතිවරයා වෙත නිකුත් කරන ලදී.

1.2 මතය

-------

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දැක්වෙන කරුණු වලින් මුල්‍ය ප්‍රකාශයන්ට වන බලපෑම හැර, 2013 දෙසැම්බර් 31 දිනට මාන්තායි නැගෙනහිර ප්‍රාදේශිය සභාවේ වැඩකටයුතුවල තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මෙහෙයුම් වල මුල්‍ය ප්‍රතිඵල සහ මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් පොදු සම්මත ගිණුම්කරණ මූලධර්මයන්ට අනුකූලව මුල්‍ය ප්‍රකාශ පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

1.3 මුල්‍ය ප්‍රකාශ පිළිබඳ අදහස් දැක්විම්

-----------------------------------------

1.3.1 ගිණුම්කරණ අඩුපාඩු

---------------------------

i. මුල්‍ය ප්‍රකාශයන්හි නිරික්ෂණය වූ ගිණුම්කරණ අඩුපාඩු වත්කම් සහ වගකීම් යටතේ පහත වගුවෙහි දැක්වේ.

| මූල්‍ය ප්‍රකාශ කෙරෙහි බලපෑම | වත්කම් | | වගකීම් | |
|---|---|---|---|---|
| | අවස්ථා සංඛ්‍යාව | වටිනාකම | අවස්ථා සංඛ්‍යාව | වටිනාකම |
| | | රු. | | රු. |
| අඩුවෙන් දැක්වීම් | 01 | 1,675 | - | - |
| වැඩියෙන් දැක්වීම් | - | - | 02 | 357,445 |
| වර්ගීකරණ දෝෂ | - | - | 01 | 2,500 |

ii. රජයේ සහ රාජ්‍ය නොවන ආයතනයන් විසින් සභාවට පරිත්‍යාග කරන ලද විෂයයන් 22 ක් අගය කර ගිණුම් ගතකර නොතිබුණි.

iii. සභාවේ වාහන 4 ක් අගය කර ගිණුම්ගතකර නොතිබුණි. එබැවින් ගිණුම්වල වාහන අගය අඩුවෙන් දක්වා තිබුණි.

1.3.2 නොසැසඳූ ගිණුම්

-----------------------

ප්‍රධාන ලෙජරය අනුව උසාවි දඩ රු.10,172,454 ක් වූ අතර අවසාන ගිණුම් අනුව එය රු.10,012,799 ක් විය.

1.3.3 විගණනය සඳහා සාක්ෂි නොවීම

-----------------------------------------

අවශ්‍ය තොරතුරු විගණනය සඳහා ඉදිරිපත් නොකිරීම නිසා වටිනාකම රු.415,130 ක් වූ ගනුදෙනු විගණනයේදී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරිමට නොහැකි විය.

1.3.4 අනුකූල නොවීම

---------------------

නීතිරීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණයන්ට අනුකූල නොවීමේ පහත සඳහන් අවස්ථා විගණනයේදී නිරීක්ෂණය විය.

| නීති,රීති, රෙගුලාසි වලට යොමුව | | අනුකූල නොවීම |
|---|---|---|
| ප්‍රාදේශීය සභා (මූල්‍ය සහ පරිපාලන) රීති - 1988 | | |
| V පරිච්ඡේදයේ 140 වගන්තිය | - | රු.1,377,412 ක් වූ නිරවුල් නොකළ අත්තිකාරම් සම්බන්ධයෙන් ලේකම්වරයා කටයුතු කර නොතිබුණි. |
| Vi පරිච්ඡේදයේ 5 වගන්තියේ 237 උප වගන්තිය | - | 2013 ජුනි 19 දින ලියන ලද රු.1,050 ක් වූ චෙක්පතක් ගෙවීම සඳහා ඉදිරිපත් කර නොතිබුණි. මේ සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි. |
| 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 132(එච්) වගන්තිය | - | රු.1,000 ට වැඩි සංග්‍රහ වියදම් සඳහා අමාත්‍යවරයාගේ පූර්ව අනුමැතිය අවශ්‍ය වන නමුත් එවැනි අනුමැතියක් නොමැතිව සභාවේ අරමුදලින් රු.40,958 ක් වූ මුදලක් වැයකර තිබුණි. |

## 2. මූල්‍ය සහ මෙහෙයුම් සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශ අනුව, සමාලෝචිත වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම් අතිරික්තය රු.10,944,203 ක් වූ අතර එයට අනුරූපව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම් අතිරික්තය රු.1,065,559 ක් විය.

2.2 මූල්‍ය පාලනය

-----------------

අයවැය ලේඛනය නිසි පරිදි පිළියෙල කර නොතිබුණි. එබැවින් අයවැයගත ආදායම් සහ වියදම් හා තථ්‍ය ආදායම් සහ වියදම් අතර පිළිවෙලින් රු.5,499,877 ක් සහ රු.1,129,951 ක් වූ වෙනස්කම් සිදු වී තිබුණි.

2.3 ආදායම් පරිපාලනය

-------------------------

2.3.1 ඇස්තමේන්තුගත ආදායම, තථ්‍ය ආදායම සහ හිඟ ආදායම

---------------------------------------------------------------------

සභාපතිවරයා විසින් ඉදිරිපත් කරන ලද පරිදි සමාලෝචිත වර්ෂය සඳහා වූ ඇස්තමේන්තුගත ආදායම, තථ්‍ය ආදායම සහ හිඟ ආදායම පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් විෂයය | ඇස්තමේන්තගත | තථ්‍ය | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය |
|---|---|---|---|
| | රු.000 | රු.000 | රු.000 |
| වරිපනම් හා බදු | - | - | - |
| බදු කුලි | 250 | 202 | - |
| බලපත්‍ර ගාස්තු | 3,340 | 225 | - |
| වෙනත් ආදායම් | 1,600 | 10,375 | 10,081 |
| | 5,190 | 10,802 | 10,081 |

2.3.2 උසාවි දඩ

--------------

සමාලෝචිත වර්ෂය සඳහා අයවිය යුතු උසාවි දඩ රු.10,012,799 ක් ලැබිය යුතු ලෙස ගිණුම් ගතකර තිබුණි. මෙම මුදල් අයකර ගැනීම සඳහා කටයුතු කර නොතිබුණි.

2.3.3 හිඟ ආදායම්

--------------

i. සමාලෝචිත වර්ෂය සඳහා වූ හිඟ කඩකුලී සහ බදු කුලී රු.68,054 ක් මෙම වාර්තාවේ දිනය දක්වා අයකර නොතිබුණි.

ii. පළාත් පාලන කොමසාරිස්වරයාගේ අංක එල්සීපී/පීඑල්/4/7/19 හා 1994 ඔක්තෝබර් 04 දින දරන චක්‍රලේඛයෙන් නියමිත පරිදි වර්ෂ 5 කට වරක් කඩකුලී සංශෝධනය කර නොතිබුණි.

2.4 වත්කම් කළමනාකරණය

-------------------------------

(i) ලෝක ආහාර වැඩසටහන මගින් සභාවට පරිත්‍යාග කරන ලද පහත සඳහන් විෂයයන් ගබඩාවේ නිශ්ක්‍රීයව තබා තිබුණි.

| විෂයය | ප්‍රමාණය |
|---|---|
| කරත්ත | 26 |
| උදළු | 122 |
| සවල | 43 |
| පිහි ( විශාල ) | 3 |
| පිහි ( කුඩා) | 8 |
| මල් කූඩ | 4 |

(ii) 2011 වර්ෂයේදී පළාත් පාලන කොමසාරිවරයාගෙන් ලද ජනන යන්ත්‍ර 2 ක් සහ ජල පොම්ප 2 ක් වර්ෂ 3 ක් ගබඩාවේ නිශ්ක්‍රීයව තබා තිබුණි.

(iii) සමාලෝචිත වර්ෂය තුලදී මිලදී ගත් විදුලි උපකරණ ගබඩාවේ නිශ්ක්‍රීයව තිබුණි.

2.5 මෙහෙයුම් අකාර්යක්ෂමතා

-----------------------------------

සංවර්ධන සංචිත අරමුදලට රු.10,802,822 ක මුදලක් වෙන්කර තිබුණි. නමුත් රු.මිලියන 4 ක් පමණක් ස්ථාවර තැන්පතුවල ආයෝජනය කර තිබුණෙන් මෙහෙයුම් අකාර්යක්ෂමතාවක් පෙන්නුම් කෙරුණි.

3. පද්ධති සහ පාලන

-------------------------

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර සම්බන්ධයෙන් විශේෂ අවධානය යොමුවිය යුතුය.

(අ) අත්තිකාරම්

(ආ) ආදායම් රැස්කිරීම

(ඇ) ස්ථාවර වත්කම්